# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | |
|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | |
| ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- | |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | |
| වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1536 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 03/10/2024<br>පැය 0530 |

# මාධ්‍ය නිවේදනය

**01. නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද කුෂ් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය.**

2024.10.02 වන දින සවස් කාලයේදී කටුනායක ගුවන්තොටුපල ගුවන් තොටුපල පරිශ්‍රයේදී පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය කටුනායක ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකයේ නිලධාරීන් සමග වැටලීමක් සිදුකර **කුෂ් මත්ද්‍රව්‍ය කිලෝ 01යි ග්‍රෑම් 883ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය ගුවන්තොටුපල ඒකකය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.10.02 වන දින දහවල් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 02ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 100 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු හා හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 900 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23 සහ 58 යන වයස්වල පසුවන බඩෝවිට ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2024.10.02 වන දින උදෑසන කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 33 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කෙසෙල්වත්ත පොලිස් ස්ථානය.**

2024.10.02 වන දින සවස් කාලයේදී කෙසෙල්වත්ත පොලිස් වසමේ අළුත්කඩේ ප්‍රදේශයේදී කෙසෙල්වත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කෙසෙල්වත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පමුණුගම පොලිස් ස්ථානය.**

2024.10.02 වන දින රාත්‍රී කාලයේ පමුණුගම පොලිස් වසමේ තල්දිය වත්ත ප්‍රදේශයේදී පමුණුගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 75 ක් ( බෝතල් 100)ක් සන්තකයේ තබාගෙන ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු ත්‍රීරෝද රථය සමග** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27ක් වන අවරකොටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව පොලිස් ස්ථානය.**

2024.10.02 වන දින රාත්‍රී කාලයේ මීගමුව පොලිස් වසමේ වැල්ලවීදිය ප්‍රදේශයේදී මීගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 67.5 ක් ( බෝතල් 90)ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38ක් වන වැල්ලවීදිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2024.10.02 වන දින රාත්‍රී කාලයේ මල්වතුහිරිපිටිය පොලිස් වසමේ අලවතුකන්ද ප්‍රදේශයේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1012 (බැරල් 05)ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33ක් වන අඹගස්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. සම්භාහන මධ්‍යස්ථානයක් මුවාවෙන් පවත්වා ගෙන ගිය ගණිකා නිවාසයක් වටලා සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.10.02 වන දින සවස් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ රජ මාවත ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සම්භාහන මධ්‍යස්ථානයක් මුවාවෙන් ගණිකා නිවාසයක් පවත්වාගෙන යන බවට ලද තොරතුරක් මත ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබා ගත් සෝදිසි වරෙන්තුවක් මත වැටලීමක් සිදුකර **ගණිකා නිවාසය කලමනාකරණය කිරීම සම්බන්ධයෙන් සැකකාරියක් සහ කලමනාකරණයට සහාය වෙමින් ගණිකා සේවයේ යෙදීමේ අරමුණින් රැදී සිටි කාන්තාවක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරියන් අවුරුදු 46 හා 55 යන වයස්වල පසුවන පරකඩුව හා කොච්චිකඩේ යන ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කරුවලගස්වැව පොලිස් ස්ථානය.**

2024.10.02 වන දින දහවල් කාලයේ කරුවලගස්වැව පොලිස් වසමේ නෙළුම්ගම ප්‍රදේශයේදී කරුවලගස්වැව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන කරුවලගස්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කරුවලගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**10. දුම්රියක ගැටී පුද්ගලයෙකු මියයාම - අළුත්ගම පොලිස් වසම.**

2024.10.02 වන දින රාත්‍රී කාලයේ අළුත්ගම පොලිස් වසමේ හෙට්ටිමුල්ල දුම්රිය ස්ථානය හා අළුත්ගම දුම්රිය ස්ථානය අතර දුම්රිය මාර්ගයේදී මරදාන සිට හික්කඩුව බලා ධාවනය වූ දුම්රියක පුද්ගලයෙකු ගැටී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 46ක් වන බේරුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අළුත්ගම පොලිසිය සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - සූරියවැව පොලිස් වසම.

2024.10.02 වන දින දහවල් කාලයේ සූරියවැව පොලිස් වසමේ සූරියවැව පදලංගල මාර්ගයේ විහාරගල ප්‍රදේශයේදී සූරියවැව දෙස සිට පදලංගල දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගයේ දකුණු පසට හැරවීමට යාමේදී ඊට පිටුපසින් පැමිණි ටිපර් රථයක් එම දිශාවටම ධාවනය කල බස් රථයකට ඉස්සර කිරීමට යාමේදී යතුරුපැදිය ටිපර් රථයේ ගැටී නැවතත් මාර්ගයේ දකුණු පස නවතාගෙන සිටි යතුරුපැදියකද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් දකුණු පස නවතාගෙන සිටි යතුරුපැදියේ පැදිකරු ටිපර් රථයට යටවීමෙන් එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 78 ක් වූ සූරියවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දකුණු පසට හැරවීමට ගිය යතුරුපැදිකාරිය හා එම යතුරුපැදියේ ගමන් කල වයස අවුරුදු 04ක දැරියක් තුවාල ලබා සූරියවැව රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා හම්බන්තොට මූලික රෝහල වෙත මාරුකර යවා ඇත.

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ටිපර් රථයේ රියදුරු අනතුරින් පසු පලාගොස් ඇත. ටිපර් රථ රියදුරු අත්අඩංගුවට ගැනීම සඳහා සූරියවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - දෙනියාය පොලිස් වසම.

2024.10.02 වන දින උදෑසන කාලයේ දෙනියාය පොලිස් වසමේ දෙනියාය කිරිවැල්දොල මාර්ගයේ කිරිවැල්දොල හන්දිය ප්‍රදේශයේදී කිරිවැල්දොල දෙස සිට දෙනියාය දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ප්‍රපාතයකට පෙරළී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු හා පිටුපස ගමන් කල වයස අවුරුදු 05ක් වන දරුවෙකු හා වයස අවුරුදු 18ක තරුණියක් තුවාල ලබා දෙනියාය රෝහලට ඇතුලත් කිරීමේදී ත්‍රීරෝද රථයේ රියදුරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ දෙනියාය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දෙනියාය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර දෙනියාය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. මාරක රිය අනතුරක් - කොස්ගම පොලිස් වසම.**

2024.10.02 වන දින උදෑසන කාලයේ කොස්ගම පොලිස් වසමේ කොස්ගොඩ කඩුගොඩ මාර්ගයේ කඩුගොඩ ප්‍රදේශයේදී කඩුගොඩ සිට පොල්හේන අතුරු මාර්ගයේ ගමන්කල කැබ් රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන දුරකතන රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කැබ් රථයේ රියදුරු හා පිටුපස ගමන් කල කාන්තාවන් තිදෙනෙකු තුවාල ලබා අවිස්සාවේල්ල රෝහලට ඇතුලත් කිරීමේදී කැබ් රථයේ පිටුපස ගමන් කල කාන්තාවක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 70 ක් වූ තුම්මෝදර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කොස්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**